**මාධ්‍ය නිවේදනයයි**

**කම්කරු දෙපාර්තමේන්තුව**

කෝවිඩ් 19 වෛරසය ව්‍යාප්තිය පාලනය කිරීමේ අවශ්‍යතාවය මත කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට හා පළාත් / දිස්ත්‍රික් කම්කරු කාර්යාල සඳහා පැමිණෙන සේවාලාභීන් ප්‍රමාණය සීමා කිරීමට තීරණය කොට ඇත.

ඒ අනුව සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයට පැමිණෙන සේවාලාභීන්
http://www.labourdept.gov.lk/index.php?option=com_content&view=article&id=351&lang=en
යන සබැඳියට පිවිස දිනයක් හා වේලාවක් වෙන් කරවා ගෙන තම සේවාවන් ලබා ගැනීමට කටයුතු කරන මෙන් දන්වන අතර පළාත් හා දිස්ත්‍රික් කම්කරු කාර්යාලය සඳහා සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලබා ගැනීමට පැමිණෙන සේවාලාභීන් එම කාර්යාලවලට අදාළ දුරකථන අංක ඔස්සේ අමතා දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. එම කාර්යාලවලට අදාළ දුරකථන අංක හා විද්‍යුත් ලිපිනයන් කම්කරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

කම්කරු නීතිවලට අදාල ඕනෑම කරුණක් සම්බන්ධයෙන් වන ලිඛිත පැමිණිල්ලක් හෝ ලිඛිත විමසීමක් තමා සේවය කරන හෝ සේවය කරන ලද ආයතනය පිහිටා තිබෙන බල ප්‍රදේශයට අයත් කම්කරු කාර්යාලය වෙත යොමු කළ හැකිය. ඒ සඳහා එම කාර්යාල වලට අදාලව ඔබට අවශ්‍ය වන දුරකතන අංක හා විද්‍යුත් ලිපිනයන් කම්කරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි

(http://labourdept.gov.lk/images/PDF_upload/notices/contacts%20by%20type.pdf) සබැඳියට පිවිස ලබා ගත හැකිය. එමෙන්ම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිතව පවතින එක් එක් අංශයන්ට අදාල සේවාවන් සම්බන්ධයෙන් පහත සඳහන් සන්නිවේදන මාධ්‍ය ඔස්සේ ලිඛිත විමසීම් සිදු කල හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

| | **අංශය/ශාඛාව** | **පැමිණිලි/විමසීම ලිඛිතව ඉදිරිපත් කළ හැකි දුරකථන අංකය** | **සන්නිවේදන මාධ්‍ය** | **පැමිණිලි/විමසීම ඉදිරිපත් කළ හැකි විද්‍යුත් තැපැල් ලිපින** |
|---|---|---|---|---|
| 1 | සේවක අර්ථසාධක අරමුදල් අංශය | 071 811 1367 | whatsApp | aclepfadmin@labourdept.gov.lk |
| 2 | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ශාඛාව | 076 144 8103 | whatsApp | epfclaim@sltnet.lk |
| 3 | සේවක අර්ථසාධක අරමුදල් | 070 2 494798 | whatsApp | acl3epf30@ labourdept.gov.lk |

| | | | | |
|---|---|---|---|---|
| | (30%) පූර්ව ප්‍රතිලාභ ගෙවීම් ශාඛාව | | | |
| 4 | සේවක අර්ථසාධක අරමුදල් මියගිය සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීම් ශාඛාව (L) | 077 - 3 018 787 | whatsApp | aclepfl@labourdept.gov.lk |
| 5 | සේවක අර්ථසාධක අරමුදල් අයකිරීම් ශාඛාව,පෞද්ගලික අර්ථසාධක අරමුදල් ශාඛාව, ආයතන ලියාපදිංචි කිරීමේ ශාඛාව | 071 8 196 852 | viber | dclepfrec@ labourdept.gov.lk |
| 6 | මධ්‍යම ලිපිගොනු අංශය | 071 - 4 408 165 | whatsApp | dolcfs@sltnet.lk |
| 7 | ශ්‍රම ප්‍රමිති අංශය | 071 – 3 642 024 | whatsApp | labourstandardsdiv@gmail.com |
| 8 | කාන්තා හා ළමා කටයුතු අංශය | 071 840 1084 | whatsApp | wca.division@yahoo.com |
| 9 | කාර්මික සම්බන්ධතා අංශය | 071- 1 914 441 | whatsApp | ir@labourdept.gov.lk |
| 10 | සේවය අවසන් කිරීමේ අංශය | 071- 3 188 793 | whatsApp | termination@labourdept.gov.lk |
| 11 | වෘත්තීය සමිති අංශය | 071 - 4 411 264 | whatsApp | tradeunion@labourdept.gov.lk |
| 12 | කාර්මික අධිකරණය | 071 - 8 080 292 | whatsApp | lc9dol@gmail.com |
| 13 | කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | 071 - 4 224 910 | whatsApp | commis@labourdept.gov.lk |
| 14 | වෘත්තීය ස්වස්ථතා අංශය | 071 7220 737 | whatsApp | occhygdiv@gmail.com |

මීට අමතරව ඔබ වෙත අඛණ්ඩව සේවාවක් ලබා දීම උදෙසා විධායක නිලධාරීන්ගේ කාර්යාලීය දුරකථන වලට ලැබෙන ඇමතුම් කාර්යාල වේලාව තුල නිලධාරීන්ගේ ජංගම දුරකථන වලට යොමු වීමේ පහසුකම සලසා ඇති අතර අදාල දුරකථන නාමාවලිය කම්කරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි http://labourdept.gov.lk/images/PDF_upload/notices/contacts.pdf සබැඳියට පිවිස ලබා ගත හැකිය. එබැවින් සංචරණයන් හැකිතාක් දුරට අවම කිරීම උදෙසා හැකි සෑම අවස්ථාවකදීම අදාල කාර්යාලය වෙත පිවිසීමකින් තොරව කාර්යාල දිනයන්හිදී කාර්යාල වේලාවන් තුල(පෙ.ව 8.30 - ප.ව 4.15 ) ඉහත සඳහන් කර ඇති ක්‍රමවේද ඔස්සේ දුරස්ථව මහජන සේවාව ලබා ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. කම්කරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය - www.labourdept.gov.lk

කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව

නීතිඥ බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05